# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2386/04 – 2024 මැයි මස 28 වැනි අඟහරුවාදා – 2024.05.28

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

මගේ අංකය: IR/COM/04/2020/04.

**කාර්මික ආරාවුල් පනත - 131 වන අධිකාරය**

බේරුම්කරණ අංශය හා කාර්මික අධිකරණය - කොළඹ

*යොමු අංකය:* A/71/2023.
IR/COM/04/2020/04.

**පළමු පාර්ශ්වය වෙනුවෙන් පෙනී සිටීම,**
නියෝජිත සුනිල් ද සිල්වා මහතා
ඉල්ලුම්කරු - එස්. එම්. ෆවුම් මයා.

එස්. එම්. ෆවුම් මයා,
අංක 277/28,
ගල්විහාර පාර,
දෙහිවල.

*පළමු පාර්ශ්වය*



*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

**දෙවන පාර්ශ්වය වෙනුවෙන් පෙනී සිටීම,**
නීති නිලධාරි දිලානි කාරියවසම් මිය.
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි චමල් සමරසිංහ මහතා.

එදිරිව

රාජ්‍ය දැව සංස්ථාව,
අංක 82,
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

*දෙවන පාර්ශ්වය*

**ප්‍රදානය**

කම්කරු හා විදේශ රැකියා අමාත්‍ය මනූෂ නානායක්කාර මැතිතුමා විසින් 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 04 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් විශේෂ ප්‍රතිපාදන) පනත සමඟ කියවා දරන පනත් වලින් සංශෝධිත වූ ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4 (1) වන වගන්තියෙන් ගරු අමාත්‍යතුමා වෙත පැවරී ඇති බලතල අනුව, 2023.10.30 හා අංක IR/COM/04/2020/04 ලිපියෙන් ඒ. බී. හේරත් වන මා බේරුම්කරු වශයෙන් මා පත් කොට මා වෙත යොමු කර ඇත.

**ආරාවුලට තුඩුදුන් කාරණය**

බේරුම්කරණය සඳහා මා වෙත යොමු කර ඇති උක්ත නියෝගය ප්‍රකාරව පහත සඳහන් දෙපාර්ශ්වය අතර උද්ගතවී ඇති කාර්මික ආරාවුලයි.

මෙම ආරාවුලට හේතු වී ඇති කාරණය ලෙස කම්කරු කොමසාරිස් ජනරාල් නීතිඥ ප්‍රභාත් චන්ද්‍රකීර්ති මහතා විසින් නිකුත් කරන ලද ඔහුගේ අංක IR/COM/04/2020/04 හා 2023.10.17 දින ලිපිය අනුව "එස්. එම්. ෆවුමි මහතාට වැඩ බලන නියෝජ්‍ය කළමනාකාර (අලෙවි) තනතුරේ සේවය කරන ලද කාලය සඳහා එනම් 2016.10.10 දින සිට 2020.02.20 දින දක්වා වැඩ බලන දීමනාවට හිමිකමක් තිබේ ද, හිමිකම් තිබේනම් එය ලබා නොදීමෙන් අසාධාරණයක් සිදුව තිබේ නම් ලැබිය යුතු සහනයන් කවරේද යන්න පිළිබඳව වේ."

**කේ. ඩී. මනෝජ් ප්‍රියන්ත,**
කම්කරු කොමසාරිස්,
කාර්මික සම්බන්ධතා අංශය,
කම්කරු කොමසාරිස් ජනරාල් වෙනුවට

EOG 05 – 0165

---

## නිවැරදි කිරීමයි

එන්. පී. මදරසිංහ,
අංක 494/ඊ,
3 වන පටුමග,
හල්බරාව පාර,
තලාහේන,
මාලඹේ.

*පළමු පාර්ශ්වය*

එදිරිව

සිලෝන් පෙට්‍රෝලියම් ස්ටෝරේජ්,
ටර්මිනල්ස් ලිමිටඩ්,
නිමාව - කොලොන්නාව.

*දෙවන පාර්ශ්වය*

*නඩු අංකය* : ඒ /14/2022.
*ගොනු අංකය* : IR/COM/02/2019/350.

උක්ත කරුණ යටතේ බේරුම්කරුගේ අත්සනින් යුතුව 2023.12.28 දිනැතිව යොමු කර ඇති A/14/2022 ප්‍රදානය *අති විශෙෂ ගැසට් පත්* අංක 2375/17 හා 2024.03.12 දිනැතිව පළ කර ඇති අතර, එහි අවසාන පිටුවේ (10A) හි (ඉ) ලෙස දක්වා ඇති කොටස පහත සඳහන් පරිදි සංශෝධනය විය යුතු බව කරුණිකව දන්වා සිටිමි.

(ඉ) අදාළ මුදල මෙම ප්‍රදානය ගැසට් කල දින සිට දින තිහක කාලයක් තුළ මැද කොළඹ සහකාර කම්කරු කොමසාරිස් වෙත තැන්පත් කරන ලෙසත්,

තව ද, බේරුම්කරුගේ නම නීතිඥ බිනර ඒ. ගුණසේකර ලෙස සංශෝධනය විය යුතු බවද වැඩිදුරටත් දන්වා සිටිමි.

**කේ. ඩී. මනෝජ් ප්‍රියන්ත,**
කම්කරු කොමසාරිස්,
කාර්මික සම්බන්ධතා අංශය,
කම්කරු කොමසාරිස් ජනරාල් *වෙනුවට.*

EOG 05 – 0176

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.